සැකසුම- ජී.ඒ.සන්ධ්‍යා ශීරාණි

ර/බල/ශ්‍රී නාරද ම.ම.වි.

පළමු වාර පරීක්ෂණය

7 ශ්‍රේණිය

බුද්ධ ධර්මය

පැය 1

**පහත සඳහන් ප්‍රශ්න වල නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න .**

1) බුදුරජාණන් වහන්සේට පළමු දානය පිළිගැන්වූයේ,
   I. සුජාතා සිටු දියණිය
   II. තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයනාව්ස්
   III. විශාකා මහෝපාසිකාව

2) තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා වූයේ ,
   I. බරණැස් සිටුතුමා
   II. අනේපිඬු සිටුතුමා
   III. යසකුල පුත්‍රයා

3) විහාරස්ථානයට ගියවිට දෙවනුව වන්දනා කරන්නේ ,
   I. බුදු පිළිම වහන්සේට
   II. සෑරදුන්ට
   III. බෝරදුන්ට

4) බුදුරජාණන් වහන්සේ ධර්මය ගුරු තනතුරෙක තබා ගැනීමට තීරණය කළ අවස්ථාවක් වන්නේ ,
   I. පළමු සතියේ
   II. දෙවන සතියේ
   III. පස්වන සතියේ

5) බුදුරජාණන් වහන්සේගේ ගිලානෝපස්ථානය ආදර්ශයෙන්ම පෙන්නුම් කළ අවස්ථාවක් වන්නේ ,

I. පූතිගත්තතිස්ස තෙරුන්ට උපස්ථාන කිරිම
II. ආනන්ද හිමියන්ට උපස්ථාන කිරිම
III. සැරියුත් හිමියන්ට උපස්ථාන කිරිම

**අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරැදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න .**

6) බුදුසසුනේ අග්‍ර දායකයා වන්නේ.............................. සිටුතුමා ය.

7) පූර්වාරාමය පූජා කරනු ලැබුයේ ................................ උපාසිකාව විසිනි .

8) සිරිත් මල්දම රචනා කළේ .................................... .

9) සිදුහත් බෝසතාණන් වහන්සේට කුසතණ මිටි පූජා කළේ........................ .

10) බුදු සසුනේ සෝවාන් වු පළමු රජතුමා වන්නේ .............................

(ඇම්.ඇල්.සිල්වා ගුරු මුහන්දිරම් තුමා , දකුණ, බිම්බිසාර, අනේපිඩු , විශාඛා )

**ප්‍රශ්න අංක 11සිට 15 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 11) | බුදු දහම | 120 |
| 12) | ධම්මපදය ගාථා | ඉසිපතනාරාමය |
| 13) | විශාඛාවගෙ ආයුෂ | පටිසෝතගාමී |
| 14) | පස්වග තවුසන් වැඩ සිටියේ | වේළුවනාරාමය |
| 15) | බිම්බිසාර රජු | 423 කි |

**අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න වලින් නිවැරදි ප්‍රකාශය හරි නම් ✔ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන් තුළ යොදන්න.**

**16)** **උරුවෙල් කාශ්‍යප ජටිල පිරිසේ අයෙකි.**
**( )**

**17)** **පළමු තෙරුවන් සරණ ගියේ උපක ආජීවකයා**
**( )**

**18)** **බුදුරදුන් මහියංගණයට වැඩියේ දුරුතු පෝය දින.**
**( )**

19) තිස්ස තෙරුන්ට කුෂ්ඨ රෝගය වැළදුනේ පෙර කළ අකුසලයකි
( )

20) රජ්ජුමාලා බුදුරදුන්ගෙන් පිහිට ලැබූ කාන්තාවකි
( )

**07 ශ්‍රේණිය**

**පළමු වාර පරීක්ෂණය - බුද්ධ ධර්මය 11 - කොටස**
**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**
**පළමු ප්‍රශ්නය හා තවත් 04 කට පිළිතුරු සපයන්න**
**……………………………………………………**

**1.**

I. බුදුරජාණන් වහන්සේ ධර්මය ගුරු තනතුරෙක තබා ගැනීමට තීරණය කළේ කීවෙනි සතියේ ද?
II. අනිමිස ලෝචන පූජාව යනු කුමක්ද ?
III. ලොවට ධර්මය දේශනා කරන ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ කවිද ?
IV. ත්‍රිපිටකය නම් කරන්න.
V. අරහං බුදු ගුණය නම් කරන්න .
VI. ඔබ නිවසේදී අනුගමනය කළ යුතු සිරිත් තුනක් ලියන්න .
VII. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළේ කාටද ?
VIII. ධනංජය සිටුතුමා තම දියණියට දුන් උපදෙස් වලින් දෙකක් ලියන්න
IX. මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න .
X. අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් නම් කරන්න .

2.

- . සිදුහත් බෝසතාණන් වහන්සේගෙ දුෂ්ක්‍රියා කාලය කොපමණද ?
- පස්වග තවුසන් නම් කරන්න .
- බුද්ධ චරිතය තුළින් ශිෂ්‍ය ජීවිතයට අසරණ සරණ ගුණය ප්‍රකට කළ හැකි අවස්ථා දෙකක් ලියන්න .

3.

- බුදු සසුනේ පළමු රහත් හැටනම නම් කරන්න .
- සත් සතිය ලියා දක්වන්න.
- ඉන් එක් සතියක වැදගත් සිදුවීම් විස්තර කරන්න .

4.

- තෙරුවන් ගුණ කීයද ?
- ඉතිපිසෝ ගාථා පාඨය නිවැරදි ව ලියන්න .
- එක් බුදු ගුණයක් තෝරාගෙන අර්ථය පැහැදිලි කරන්න .

5.

- සීලය යනු කුමක්ද ?
- සිරිත් විරිත් යන වචන දෙකේ අරුත් දක්වන්න .
- පාසලේ දී ප්‍රදර්ශනය කිරිමට සුදුසු සිරිත් විරිත් වලට අදාළ ආදර්ශ පාඨ පහක් ලියන්න .